# රජයේ නිවේදනයයි

## 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත

## 2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ 11 වන තීරයේ අනුරූප සටහන් වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2020 ඔක්තෝබර් මස 14 දින සිට ආරම්භ වන මාස 03 ක් දක්වා වූ කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2020.07.31 දිනැති අංක 2186/32 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් බොම්බයි ළූණු සඳහා ප්‍රකාශිත අදාල නියමය සහ 2020.05.21 දිනැති අංක 2176/18 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් පරිප්පු, ටින්මාළු සහ සීනි සඳහා ප්‍රකාශිත අදාල නියමය 2020 ඔක්තෝබර් මස 14 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

මහින්ද රාජපක්ෂ
මුදල් අමාත්‍ය

2020 ඔක්තෝබර් මස 13 වන දින
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේදීය.

# උපලේඛනය

| 1 වන තීරය | | | | 11 වන තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං. වි. ශීර්ෂය | සං. වි. සංකේතය | විස්තරය | |
| 1 | 07.03 | 0703.10.20 | බොම්බයි ළූණු | කි. ග්‍රෑමයට ශත 25 |
| 2 | | 0713.40.11 | සම්පූර්ණ - මයිසූර් පරිප්පු (රතු පරිප්පු) | කි. ග්‍රෑමයට ශත 25 |
| | | 0713.40.12 | පියළිකළ- මයිසූර් පරිප්පු (රතු පරිප්පු) | කි. ග්‍රෑමයට ශත 25 |
| | | 0713.40.21 | සම්පූර්ණ - කහ පරිප්පු | කි. ග්‍රෑමයට ශත 25 |
| | | 0713.40.22 | පියළිකළ - කහ පරිප්පු | කි. ග්‍රෑමයට ශත 25 |
| 3 | 16.04 | 1604.11 | සැමන් | කි. ග්‍රෑමයට ශත 25 |
| | | 1604.12 | හුරුල්ලන් | කි. ග්‍රෑමයට ශත 25 |
| | | 1604.13 | සාඩින්, සාඩිනෙල්ලා සහ බ්‍රිස්ලින් හෝ හාල්මැස්සන් | කි. ග්‍රෑමයට ශත 25 |
| | | 1604.14 | ඇටවල්ලා, ස්කිප්ජැක් සහ බොනිටෝ (සර්ඩා විශේෂයන්) | කි. ග්‍රෑමයට ශත 25 |
| | | 1604.15 | මැකරල් | කි. ග්‍රෑමයට ශත 25 |
| | | 1604.16 | ඇන්චෝවීසි | කි. ග්‍රෑමයට ශත 25 |
| | | 1604.17 | ආඳන් | කි. ග්‍රෑමයට ශත 25 |
| | | 1604.19 | අනෙකුත් | කි. ග්‍රෑමයට ශත 25 |
| | | 1604.20 | අනෙකුත් සකස් කළ හෝ සුරක්ෂිත මාලු | කි. ග්‍රෑමයට ශත 25 |
| 4 | 17.01 | | ඝන තත්ත්වයේ ඇති උක් හෝ බීට් සීනි සහ රසායනික පවිත්‍ර සුක්‍රෝස් | |
| | | | එකතු කරන ලද රස කාරක හෝ වර්ණ අඩංගු නොවූ ශුද්ධ නොකළ සීනි | |
| | | 1701.12 | බීට් සීනි | කි. ග්‍රෑමයට ශත 25 |
| | | 1701.13 | උක් සීනි | කි. ග්‍රෑමයට ශත 25 |
| | | 1701.14 | අනෙකුත් උක් සීනි | කි. ග්‍රෑමයට ශත 25 |
| | | | අනෙකුත් | |
| | | 1701.91 | එකතු කරන ලද රස කාරක හෝ වර්ණක අඩංගු | |
| | | 1701.91.10 | සීනි | කි. ග්‍රෑමයට ශත 25 |
| | | 1701.91.90 | අනෙකුත් | කි. ග්‍රෑමයට ශත 25 |
| | | 1701.99 | අනෙකුත් | |
| | | 1701.99.10 | සුදු ස්ඵටිකකෘත උක් සීනි | කි. ග්‍රෑමයට ශත 25 |
| | | 1701.99.20 | සුදු ස්ඵටිකකෘත බීට් සීනි | කි. ග්‍රෑමයට ශත 25 |
| | | 1701.99.30 | අනෙකුත් සීනි | කි. ග්‍රෑමයට ශත 25 |
| | | 1701.99.90 | අනෙකුත් | කි. ග්‍රෑමයට ශත 25 |